The Journal of the Faculty of Humanities (JHU) (2025), Volume 33, Issue 2, 115-140
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (On2ine)

පොළොන්නරු යුගයේ සන්නස් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පී. ජී. පියුමි සඳමාලි

Abstract

Polonnaruwa is the second period of the Sri Lankan historical chapter, and according to the definition of linguists, it belongs to the medieval period. This is the first period of Sinhala Sannas literature. According to H. C. P. Bell, Sannas is a royal document issued only by the king using materials such as gold, silver, copper, or palm leaves. The facts about development of Sannas in Sri Lanka extend to Abhayagiriya Copper Sannas of the Anuradhapura period, Vallipuram Gold Sannas, but a Sannas sheet having the formative characteristics that a Sannas should have was first created in the Polonnaruwa era. Panakaduwa Sannasa is the first Sannasa of this era and can be pointed out as Allai Sannasa, Doratiyava Sannasa, Bamunagala Sannasa, and Parivara Sannasa. Accordingly, the problem related to the research, which is an investigative study of Sannas in the Polonnaruwa period, is to examine how the political, economic, religious, and social factors of the Polonnaruwa period, as well as medieval language characteristics, are reflected in the Sannas of the Polonnaruwa period. Among the objectives of this research are to identify the starting point of Sinhala Sannas, to find out the number of Sannas belonging to the Polonnaruwa period, to facilitate modern studies on Sannas, to outline the precise subject matter to alleviate misconceptions about Sannas literature, and to fill the gap as information about the Sannas of the Polonnaruwa

period is scarce. Being the main objective, this study conducted a field study as the primary source under the qualitative research method, and books and research works were used as secondary sources. Magazines, newspapers, and websites were used as secondary sources. By collecting and analyzing data through the above methods, historical facts that are not mentioned in works like the Mahavamsa were revealed, and many linguistics peculiarities were understood, including the political, religious, economic, and social factors of the That era as well as the language characteristics of the Middle Ages.

Keywords: *Allai, Bamunagala, Doratiya, Panakaduwa, Polonnaruwa era.*

හැඳින්වීම

ශ්‍රී ලාංකේය ඓතිහාසික කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය අනුග්‍රහය යටතේ නිකුත් කළ ක්‍රමවත් පරිහාර ලියවිල්ල සන්නස් නමින් හැඳින්වේ. දැනට පවතින සාධක අනුව මෙරට සන්නස් ප්‍රදානයෙහි ඉතිහාසය පිළිබඳ තොරතුරු පොළොන්නරු යුගයට අයත් වේ. එච්. සී. පී. බෙල් පවසන පරිදි සන්නස් යනු රත් රන්, රිදී, තඹ හෝ තල්පත් වැනි අමුද්‍රව්‍යයන් භාවිත කරමින් රජු විසින් පමණක් නිකුත් කරන්නා වූ රාජකීය ලේඛනයකි (Bell, 1892). ලංකාවේ සන්නස් විකාසනය පිළිබඳ තොරතුරු අනුරාධපුර අභයගිරිය තඹ සන්නස, වල්ලිපුරම් රන් සන්නස දක්වා විහිද ගිය ද සන්නසක තිබිය යුතු ආකෘතික ලක්ෂණයන්ගෙන් හෙබි සන්නස් පත්‍රයක් ප්‍රථම වරට නිර්මාණය වූයේ පොළොන්නරු යුගයේ දී ය. ඒ අනුව මෙහි දී පොළොන්නරු යුගයේ සන්නස් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

පර්යේෂණ ගැටලුව සහ අරමුණ

සන්නස් වනාහී සුවිශේෂ වැදගත්කමක් සහිත රාජකීය ප්‍රදාන විශේෂයකි. මේ පිළිබඳව තොරතුරු ඉතාමත් විරල හෙයින් ද, ඇතැම් තොරතුරු විවාදාපන්න හෙයින් ද, සන්නස් හා සම්බන්ධ ගැටලු

රාශියක් පැනනැගී ඇත. එය කෙසේ වුව ද වෙනත් ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් නොවන අප්‍රකට තොරතුරු රැසක් සන්නස්වල දැකගත හැකිවීම සුවිශේෂ ලක්ෂණයකි. ඒ අනුව පොළොන්නරු යුගයේ සන්නස් සාහිත්‍යයෙන් හෙළි කරගත හැකි අප්‍රකට ඓතිහාසික තොරතුරු කවරේ ද? යන්න මෙම පර්යේෂණයේ දී සොයා බැලේ. තව ද එකී තොරතුරු කොතෙක් දුරට ඓතිහාසික ජනප්‍රිය මූලාශ්‍රය සමඟ සමපාත වන්නේ දැයි සොයා බැලීමට ද අපේක්ෂා කෙරේ. එමෙන් ම මෙම පර්යේෂණයෙහි අරමුණු අතර පොළොන්නරු යුගයේ සන්නස් සාහිත්‍යය මගින් හෙළිවන අප්‍රකට තොරතුරු අධ්‍යයනය කිරීම, තත්කාලීන සමාජ තොරතුරු විමසා බැලීම, සන්නස් පිළිබඳ නූතන අධ්‍යයනයන් පහසු කරවීම, යනාදිය ප්‍රධාන වෙයි.

සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණට අදාළ සාහිත්‍ය විමර්ශනය සහ පර්යේෂණ රික්තය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සන්නස් පිළිබඳව තොරතුරු සංගෘහිත ප්‍රධාන කෘතිය වන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයෙහි මහාචාර්යවරයකු වන ආනන්ද තිස්ස කුමාරගේ **සිංහල සන්නස් හා තුඩපත්** (2006) යන කෘතියයි. මෙම කෘතියෙහි සිංහල සන්නසෙහි ක්‍රම විකාසනය, ප්‍රදානය සහ ආකෘතිය, දායක ප්‍රතිග්‍රාහක තොරතුරු, සන්නස් ප්‍රදානවලින් හෙළිවන දේශපාලන හා පරිපාලන සංස්ථා යනාදී තොරතුරු සංක්ෂිප්තව දක්වා ඇත. එම කෘතියෙහි පොළොන්නරු යුගයට අයත් ජනප්‍රිය සන්නස් පමණක් නාම මාත්‍රිකව පෙන්වා දුන්න ද පොළොන්නරු යුගයේ සන්නස් පිළිබඳව හෝ සන්නස්වල පවත්නා අප්‍රකට තොරතුරු පිළිබඳව හෝ අවධානයක් යොමු කර නොමැත.

මීට අමතරව පොළොන්නරු යුගයේ ප්‍රථම සන්නසක් වන **පනාකඩුව සන්නස** පිළිබඳව **Epigraphia Zeylanica Vol. V** දක්වා ඇත. පී. ඊ. ඊ. ප්‍රනාන්දු අල්ලයි සන්නස පිළිබඳ **The Sri Lanka Journal of the Humanities** (1978) සඟරාවෙහි කරුණු හෙළි කර ඇත. Codrington H. W. And D. P. D Mirihelle යන දොදනා **Journal Of The Ceylon Branch Of The Royal Asiatic Society** (Vol. XXIX, 1925) යන සඟරාවෙහි දොරටියා සන්නස පිළිබඳ තොරතුරු දක්වා ඇත.

මීට අමතරව ජී. එස්. රණාවැල්ලගේ **Inscription of Ceylon** (2007) සඟරාවෙහි Vol. VI හි පනාකඩුව තඹ සන්නස, අල්ලයි සන්නස සහ දොරටියාව සන්නස පිළිබඳ තොරතුරු අන්තර්ගත වෙයි. මීට අමතරව කොත්මලේ අමරවංශ හිමියන්ගේ **ලක්දිව සෙල්ලිපි** (2014) නම් කෘතියෙහි පනාකඩුව තඹ සන්නස පිළිබඳව තොරතුරු අන්තර්ගත ය. මැන්දිස් රෝහණධීර **බද්දේගම ගිං ගඟේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්** (2011) යන කෘතියෙහි බමුණාගල සන්නස ප්‍රමුඛ අල්ලයි සන්නස, දොරටියාව සන්නස පිළිබඳ විවරණය කරයි. දේව මයිකල් ද සිල්වාගේ **පනාකඩුව තඹ සන්නස** යන කෘතියෙහි (2003) පනාකඩුව තඹ සන්නසෙහි ශෛලිය සම්බන්ධ තොරතුරු සහ අතීත ලංකාවේ අධිකරණ විධික්‍රමය පිළිබඳව තොරතුරු අඩංගු වෙයි. නමුත් පොළොන්නරු යුගයේ සන්නස්හි අප්‍රකට තොරතුරු පිළිබඳව අවධානය යොමුකර නොමැත. ඒ අනුව පොළොන්නරු යුගයේ සන්නස්වලින් පිළිබිඹු වන අප්‍රකට තොරතුරු පිළිබඳව යම් කිසි රික්තයක් ඇති බව ද මෙමගින් පැහැදිලි ය.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට යටත්ව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදු කළ අතර පර්යේෂණාත්මක කෘති ද්වීතීක මූලාශ්‍රය ලෙස ද, සඟරා, තෘතීයික මූලාශ්‍රය ලෙස ද යොදාගෙන තිබේ.

සාකච්ඡාව

පුරාණ ශ්‍රී ලංකාවේ රජුගේ හා ප්‍රාදේශික පාලකයන්ගේ ප්‍රධානත්වයෙන් විවිධ දීමනා හා වරප්‍රසාද ලබා දී ඇති බව පැහැදිලි කරුණකි. මේවා සන්නස් ප්‍රදානයට යම් පමණකට සමාන වුව ද සන්නස් ප්‍රදාන යනු විශේෂ අර්ථයකින් ක්‍රියාත්මක වූ ප්‍රදාන විශේෂයකි. මේ පිළිබඳ එච්. සී. පී. බෙල් පළමුව අදහස් දැක් වූ අතර පසුව ආනන්ද කුමාරස්වාමි මෙසේ පෙන්වා දී ඇත. සන්නස වැඩි වශයෙන් ලියනු ලැබුවේ තඹ පත් මත ය. රන්, රිදී පත් කලාතුරකින් මේ සඳහා යොදා ගෙන ඇත. මේවාහි රාජ්‍ය ලාංඡනය අනිවාර්යෙන් යොදා

තිබෙන අතර එය 'ශ්‍රී' වශයෙන් සලකුණු කර තිබේ (කුමාරස්වාමි, 1962). මීට අමතරව ආනන්ද තිස්ස කුමාර ද සන්නස යන්න දීර්ඝ වශයෙන් විග්‍රහ කරයි. එනම්,

සංස්කෘත 'හංස+සංඥා' (හංසයාගේ සලකුණ) යන්නෙන් සිංහලයට ප්‍රභින්න වන 'හස්+සන්' යන වචනය පසුව 'සන්+හස්' යනුවෙන් පෙරළී ක්‍රමයෙන් පැමිණ 'සන්+හස්' වශයෙන් වදන් පූර්ව රූප සන්ධි ක්‍රමයට සුසැදුණකි. මේ අනුව හංසවාචී 'හස්' යන්න ද සංඥාවාචී 'සන්' යන්නද සිංහලයට මාතෘ භාෂාවෙන් තත්භව වී රාජකීය ලාඤ්ඡන අර්ථයේ ව්‍යවහාර ප්‍රාප්ත වූ බව පෙනේ. රාජකීය මුද්‍රාවට මේ අවධිය තුළ හංස රූප සහිත සංකේත භාවිත වූ නිසාදෝ මෙම නාමය මෙහිදී භාවිත කර ඇත. මෙලෙස සංස්කෘත හා පාලි ස්වරූපයෙන් පර්යාය ලෙස රාජශාසන, රාජපණ්ණ, තාම්‍රශාසන, තාම්බ්‍රශාසන, තඹපත්, තඹපත් සන්නස, තඹ සන්නස (තිස්ස කුමාර, 2006) ආදි වශයෙන් ව්‍යවහාරයට පත්ව ඇත. ඒ අනුව ගුණසේන ශබ්දකෝෂයෙහි සන්නස් වු කලී කෙනෙකුට රජයෙන් වතුපිටි ආදිය ප්‍රදානය කිරීමේ දී දෙන රාජ මුද්‍රාව සහිත ලියවිල්ල (විජයතුංග, 2017) බව සඳහන් කරයි. ඉඩම් පවරා දීමේ නිත්‍ය වාර්තා පිළිබඳ අධ්‍යයනයක දී එච්. ඩබ්. කොඩ්රින්ටන් 'තඹ පත්' යන්න සිංහලයෙන් 'සන්නස්' හෝ 'සන්නස' ලෙස ව්‍යවහාර වන බවත් මෙය පදගතාර්ථයෙන් 'අත්සන' සහ 'මුද්‍රාව' වන නමුත් සාමාන්‍යයෙන් ඉන්දියාවෙහි තඹ පුවරුවල දක්නට ඇති මුද්‍රාව ලාංකේය සන්නසෙන් සම්පූර්ණයෙන් ම අතුරුදහන් වී ඇති බවක් දක්වයි. එසේ ම කලාතුරකින් දක්නට ලැබෙන පරිදි තඹ පත් කිහිපයක ලියැවුණු ප්‍රදානයක පවා මුද්‍රාව දක්නට නොලැබෙන බවත් සන්නසක අනිවාර්ය වූ මුද්‍රාව පිළිබඳව අවධානය ඉතා වැදගත් වූවක් බවත් ඔහුගේ අදහස ය (කොඩ්රින්ටන්, 1980).

ආනන්ද කුමාරස්වාමි 'සන්නස් වැඩි වශයෙන් ම ලියනු ලබන්නේ තඹ පත්වල බවත්, රන් හා රිදී පත්වල බහුල ලෙස නොලියන බවත්, පෙන්වා දෙයි. සන්නසක් මගින් ආගමික සිද්ධස්ථාන, ප්‍රවේණි, ගම් ලබා දී ඇත. සන්නස් වැනි මෙවැනි සෑම දීමනාවක ම මුලට 'ශ්‍රී' යන්න ඇතුළත් වන සේ රාජ්‍ය ලාංඡනය චාම් පසුබිමක රනින් ගිල්වා තිබේ. එවිට ඉලුප්පුණු නාළාකාර රත්රන් 'ශ්‍රී' ආකෘතියක් තඹ පත්හි මතුව පෙනෙයි' (කුමාරස්වාමි, 1962) ලෙස පෙන්වා දෙයි.

The kandyan kingdom කෘතියට අනුව සන්නස්වල අගය විග්‍රහ කරන ආචාර්ය දේව රාජාගේ අදහස මෙසේ ය. ඔහුට අනුව සන්නස් සඳහා බහුලව තඹ යොදා ගත් බවත් කලාතුරකින් රන්, රිදී භාවිත වී ඇති බවත්, තවද පාෂාණ සහ තල්පත් ද මේ සඳහා භාවිත කර ඇති බවත් පෙන්වා දෙයි. එසේ ම එහි මූලික අධ්‍යයනවලින් පෙන්වා දී ඇත්තේ සන්නසක අනිවාර්යෙන් ම රාජ්‍ය ලාංඡනය ගැබ් විය යුතු බවත් 'ශ්‍රී' යන සංකේතයෙන් යෙදුණ බවත් එහි එකම ප්‍රදායකයා තත්කාලීන රාජ්‍ය විචාරන රජතුමා බවත් ය (Dewaraja, 1972).

උක්ත නිර්වචනයන්ට අනුකූලව විමසා බලන කල සන්නස යනු ආයතනයකට විහාරස්ථානයකට හෝ පෞද්ගලික වශයෙන් සිදුකරන ඉඩකඩම්, නිවාස, පොකුණු, ධන ධාන්‍ය හෝ වෙනත් භෞතික වස්තු හා තාන්න මාන්න වශයෙන් සිදුකරන තනතුරු ප්‍රදානයන් ලෙස හඳුනාගත හැකි ය. එය ලෝහයක හෝ පුස්කොළ පොතක් මත රාජකීය අනුමැතිය ඇතිව නිකුත් කරන ලේඛනයකි. මෙය බලාත්මක වන්නේ රාජ්‍ය මුද්‍රාව හෝ අත්සන ඇතොත් පමණි.

ඒ අනුව මුල් කාලීන සන්නස්වල 'සන්නස' යන වචනය භාවිත කළ සෙයක් දක්නට නොලැබුණු බවට විචාරකයින් අදහස් දැක්වුව ද මෑත කාලයෙහි හමු වූ සන්නසක් වන බමුණාගල තඹ සන්නසෙහි ප්‍රථම වරට 'සන්නස' යන පදය දක්නට ලැබෙන බව කිව යුතු ය. අනතුරුව මහනුවර යුගයේ මෙම පදය බොහෝ සෙයින් භාවිත කළ බව එකල සන්නස් සාහිත්‍යය තුළින් පැහැදිලි වෙයි. සන්නස් සාහිත්‍යය පිළිබඳ තතු අනුරාධපුර යුගය දක්වා දිවගිය ද තත් යුගයේ හමුවන අභයගිරිය, වල්ලිපුරම් රන් සන්නස්හී සන්නසක තිබිය යුතු ආකෘතිකමය ලක්ෂණයන් අන්තර්ගත නොවේ. දැනට හමු වී ඇති තොරතුරු අනුව සන්නස් සාහිත්‍යංගයෙහි ආරම්භක අවස්ථාව සනිටුහන් වනුයේ පොළොන්නරු යුගයේ දී ය.

පොළොන්නරු යුගයෙහි සන්නස්

පොළොන්නරු යුගයේ සන්නස් ප්‍රදානයන් විමසා බලන කල තත් යුගයේ බොහෝ සෙයින් දැකගත හැකි වන්නේ තඹ ලෝහය භාවිත කරමින් නිර්මාණය කරන ලද සන්නස් පත්‍ර ය. (මෙහි දී

පොළොන්නරු යුගයේ ප්‍රදානය කළ ගල් සන්නස් පිළිබඳව අධ්‍යයනය යොමු නොකෙරේ). මෙම යුගයට අයත් ප්‍රථම තඹ සන්නස පිළිබඳව විවිධ මත පවතින්නේ නිශ්ශංකමල්ල රජු සඳහන් කළ ඇතැම් ප්‍රකාශ හේතුවෙන් ය. ප්‍රථම තඹ සන්නස තමාගේ නිර්මාණයක් වන බව නිශ්ශංකමල්ල රජ සිය ශිලා ලිපි තුළ සඳහන් කරවන්නේ මෙපරිද්දෙන් ය.

"පෙර පවත් නොවූ තාම්බ්‍ර ශාසන අකුරු කොටවා" (Wickramasinghe, Vol II, 1928; 22 P).

යනුවෙන් පෙර දක්නට නොලැබුණු ලක්ෂණයක් වන තඹ පත්වල ප්‍රථමයෙන් අක්ෂර තමා ලියූ බව එහි සඳහන් කරයි. එයට අනුව බලන කල දැනට විද්‍යමාන නිශ්ශංකමල්ල රජුගේ (ක්‍රි. ව. 1187-1196) ප්‍රථම සන්නස වන්නේ **අල්ලයි තඹ සන්නස** ය. එහෙත් ඊට පෙර I විජයබාහු රජුගේ (ක්‍රි. ව. 1055-1110) **පනාකඩුව තඹ සන්නස** නිර්මාණය වී තිබුණ ද නිශ්ශංකමල්ල රජු ප්‍රථමයෙන් ම තඹ සන්නසක් තමා නිර්මාණය කළ බව පෙන්වා දෙයි.

එහෙත් මෙතෙක් ශ්‍රී ලංකාවේ පැරණිතම සන්නස ලෙස හඳුනාගෙන ඇත්තේ **පනාකඩුව තඹ සන්නසයි**. මෙම සන්නස ප්‍රදානය කර ඇත්තේ I වැනි විජයබාහු රජු (ක්‍රි. ව. 1055-1110) වන අතර එමඟින් සොළී පාලනය සමයේ ආරක්ෂාව පිණිස වනයේ සැඟව සිටි තමා හට රැකවරණය සැපයූ සිත්තරුබිම් බුදල්නාවන්ට ලබාදුන් විශේෂ වරප්‍රසාද රාශියක් එහි දක්වා ඇත (අමරවංශ හිමි, 1967).

තඹ සන්නස් භාවිතය තමා ආරම්භ කළ බවට නිශ්ශංකමල්ල රජතුමා ශිලා ලේඛන කිහිපයක ම සඳහන් කරන බව උක්ත දැක්වීමි. එහෙත් මේ පිළිබඳ විමසන කල නිශ්ශංකමල්ල රජතුමාගේ රාජ්‍ය සමයට පෙර නිර්මාණය කළ විජයබා සමයේ පනාකඩුව තඹ සන්නස පිළිබඳව දැන නොසිටියේ ද? එසේත් නැතහොත් ඔහු දැනගෙන ම එලෙස ප්‍රකාශ කළේ ද? යන්න ප්‍රත්‍යක්ෂ නිවැරදි සාක්ෂියක් නොමැත. ඒ අනුව සන්නස් බිහිවීමෙන් විද්‍යමාන වන්නේ සන්නස් සාහිත්‍ය මෙරට ස්ථාපිත වී ක්‍රමයෙන් විකාසනය වීමේ මූලික අවස්ථාව මෙකල සිදු වූ බවයි. නිශ්ශංකමල්ල රජු එම ලේඛනයන් තුළ ඉර හඳ පවතින තාක් බලාත්මක වන පරිදි සිදුකර ඇති ප්‍රදානයන් වේයන්, මීයන් කන තල්පත්වල ලිවීමෙන් එය දියෙහි ඇඳි රේඛාවක් ලෙස නිෂ්ඵල

වන නිසා තඹ පත්‍ර මත ලිවීමේ ක්‍රමය තමා ලක්දිව ආරම්භ කළ බව පෙන්වා දී ඇත. නිශ්ශංකමල්ල රජුගේ මෙම ප්‍රකාශය එතුමාගේ අල්ලයි සන්නසෙහි අන්තර්ගතය යන්න ව්‍යවහාරයක් පවති. එය මෙසේ ය.

> නිශ්ශංකමල්ල රජුට අයත් කන්තලේ අල්ලයි තඹ සන්නස හෙවත් අල්ලයි සන්නස සුවිශේෂ තඹ සන්නසකි. එහි දැක්වෙන පරිදි විවිධ ප්‍රදාන කිරීමට තඹ ලෝහයෙන් සැදුම්ලත් සන්නස් ප්‍රථමයෙන් භාවිත කළේ එතුමා බව දක්වා ඇත (භාෂා අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය, 2018).

ඒ අනුව මෙය නිරවද්‍යය වූ ව්‍යහාරයක් ද සාවද්‍ය වූ ව්‍යවහරයක් ද යන්න සොයා බැලිය යුතු ය. එයට හේතුව වන්නේ එවැනි ආන්දෝලනාත්මක විෂය කරුණු මාධ්‍යයෙහි ශාස්ත්‍රඥාන පිපාසිතයන් ඒවා ග්‍රහණය කර ගැනීමේ දී මහත් දුෂ්කරතාවන්ට පත්වන හෙයින් ය. කෙසේ නමුත් නිශ්ශංකමල්ල රජුගේ අල්ලයි තඹ සන්නසෙහි එබඳු කිසිඳු සඳහනක් දක්නට නොමැත. එසේ හෙයින් එය සඳහන් වන්නේ කුමන ස්ථානයක ද යන්න විමසා බැලීම යෝග්‍ය ය.

එම පාඨය සඳහන් වන්නේ A slub Inscription of Nissankamalla යන ශිලා ලිපියෙහි ය.

> නොඑක්ලෙසැ දස්කම් කළවුන් (ට)........... ද.... හිරසඳපවත්නා තෙක් පවත් වුව මැනැවැයි (සි)තා වදරා වෙයන් මීයන් ඇතුළුවූවන් විසින් සොදුවවු තල්පතැ නොලියවා ලක්දිව පෙර පවත් නොවූ තාම්බ්‍රශාසන අකුරු කොටවා පවත් කොටත (Wickremasinhe De. Silva, Vol II, 1928).

ඒ අනුව නිශ්ශංකමල්ල රජගේ (දැනට විද්‍යමාන) ප්‍රථම සන්නස වන්නේ අල්ලයි සන්නසයි. ඊට අනුව නිශ්ශංකමල්ල රජු කළ උක්ත ප්‍රකාශයෙන් උද්ගත වන ගැටලු රාශියකි. එනම් තඹ පත්හි ලිවීම මෙතුමා ආරම්භ කළේ නම් ඊට පෙර දී රචනා කරන ලද විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නස ප්‍රථම තඹ සන්නස නොවන්නේ ඇයි? යන්න ප්‍රමුඛ ගැටලුවයි. එතුමාගේ චරිතය දෙස බලන කල්හි ඔහු තම පෞරුෂය සකසා ගැනීමට හා පවත්වාගෙන යෑමට විවිධ

පුරසාරම් දෙඩූ පාලකයෙක් වුව ද ඉහත ප්‍රකාශය මගින් පාඨක අපට සිතීමට යමක් ශේෂ කොට ඇත. නිශ්ශංකමල්ල රජු එය සඳහන් කළේ ඉහත දැක් වූ පනාකඩුව තඹ සන්නස පිළිබඳව නොදැන නොවිය යුතු ය. මන්ද යත්: විජයබාහු රජු ඊට ශත වර්ෂයකට පමණ ඉහත දී පොළොන්නරුව පාලනය කළ කීර්තිධර නරපතියෙක් නිසා එතුමාගේ දේශපාලනික කාර්යභාරය පිළිබඳව මනා අවබෝධයක් නිශ්ශංකමල්ල රජුට තිබිය යුතු යැයි සිතීම යුක්ති යුක්ත ය.

ලංකාවේ රචනා වී ඇති මීළඟ සුවිශේෂ සන්නස වන්නේ **දොරටියාව සන්නසයි.** මෙය ප්‍රදානය කර ඇත්තේ ලංකාධිකාර ලොලු පැලැකොළු ලෝකේනාවන්හට ය. නිශ්ශංකමල්ල රජු රාජ්‍යත්වයට පත් වී සිව්වන රාජ වර්ෂයේ දී මොහු විසින් විජය ශ්‍රී මහාපාය (රුවන්වැලි මහා සෑය අර්ථවත් වන බවට අදහසක් ඇත) පිළිසකර කළ දස්කමට මායා රටෙහි දොරටියාව පමුණුව ලබා දී ඇත (රෝහණධීර, 2011).

මෙහි තල් පතක ලියු ලේඛනයක් පමණක් වත්මන ශේෂව පවතින අතර **බමුණාගල තඹ සන්නස** ද පොළොන්නරු යුගයේ සන්නසකි. බමුණාගල තඹ සන්නසෙහි දැක්වෙන ආකාරයට පමුණු ප්‍රදානය සඳහා පසුබිම්ව ඇත්තේ එකල පැවැති ද්‍රවිඩ වියවුල සංසිඳුවා පස්වන දවස පහන් වන්නට පැය දෙකක් ඇතුළත කෝට්ටයේ සිට ගොස් මුදුකරයේ සිටි අන්ණා ඈපා 'සොළීන්' බැඳ ගෙන්වා සොළී සෙනඟ මරා කිත් කිළිගු නාවා අල්වා බැඳ ඇතුන්, අසුන්, සමඟ සොළී ඈපාණන් අල්වා ගැනීම හා සම්බන්ධවයි.

සන්නස් විමර්ශනය

ප්‍රථම රාජධානිය වූ අනුරාධපුර රාජධානිය පොළොන්නරුවට විතැන් වීමට බලපෑවේ විදේශීය ආක්‍රමණයන්ගෙන් එල්ල වූ දැඩි බලපෑම් ය. මෙකල දේශපාලන ප්‍රපංචයෙහි යම්කිසි අස්ථාවරත්වයක් දැකගත හැකි වූ අතර එය I විජයබාහු රජුගේ **පනාකඩුව තඹ සන්නස** තුළින් පිළිබිඹු වෙයි. **පනාකඩුව තඹ සන්නස** පොළොන්නරු යුගයේ ප්‍රථම භාගයට අයත් වන්නා වු සන්නසකි. එහි I විජයබාහු රජු ද්‍රවිඩ සේනාවන්ගෙන් සිදු වූ ආක්‍රමණ නමැති අඳුර දුරු කළ බවත්, මුළු ලක්දිව එක්සේසත් කළ රාජ්‍ය නායකයා බවට පත් වූ

බවත් මෙසේ සඳහන් කරයි. "විජයබාහු රජ පා වහන්සේතුමා සිය වික්මෙන් දෙමෙළ බලමුළු අනුරු දුරු ලා මුළු ලක්දිව එක් සේසත් කැරැ" (Ranawella, 2007). ඒ අනුව I විජයබාහු රජ වීමට ප්‍රථම මෙම සමාජ ක්‍රමය විනාශ කිරීමෙහි ලා බොහෝ අභියෝගයන්ට මුහුණ දුන් බව පැහැදිලි ය. මෙම ද්‍රවිඩ ආක්‍රමණය හේතුවෙන් සමාජයෙහි පැවති සියලු ම ක්ෂේත්‍රයන් පරිහානියට පත් වීමත් සමඟ මූලික අවශ්‍යතාවන් පවා සපුරා ගැනීමට නොහැකි තත්ත්වයක් උදා විය. රජ පවුලට ද සිදු වූයේ වන මුල්, වන එලා ආහාරයට ගනිමින් සිය ජීවිතය ආරක්ෂා කර ගැනීමට ය. එකල ජනයාට පොළොන්නරු යුගයේ මුල් භාගය වන විට සමාජ අක්‍රමිකතා රැසකට මුහුණ දීමට සිදු විය.

පොළොන්නරු යුගයේ මධ්‍යම අවධිය පිළිබඳ සමාජ තොරතුරු **අල්ලයි සන්නස, දොරටියාව සන්නස** ආදි සන්නස් තුළින් පිළිබිඹු වෙයි. එහි දී මෙකී සමාජ අස්ථාවරත්වය තුරන් කිරීම සඳහා නිශ්ශංකමල්ල රජු තුලාභාර ආදි දානාදිය ලබාදෙමින් සමාජය සුඛිත මුදිත කිරීමට ගත් උත්සාහය අගය කළ යුක්තකි. මීට අමතරව පොළොන්නරුව යුගයෙහි අවසන් භාගයට උරුමකම් කියන්නා වූ සන්නසක් වන **බමුණාගල තඹ සන්නස** ඉතා සුවිශේෂ ය. එහි ද අප්‍රකට චෝළ ආක්‍රමණයක් පිළිබඳව සඳහන් වෙයි. කිසිඳු ඓතිහාසික මූලාශ්‍රයක මෙකී ආක්‍රමණය පිළිබඳව සඳහන් නොවූව ද මෙය ඉතා දරුණු අන්දමින් පැවැති බව "සොළී රටැ සිටැ සිවුරඟැ සෙනඟ පිරිවරා මාවුටුතොට සිල්ලමට පාරු පිටින් බැසැ මාවුටුතොටය පැහැරැ සොළී දෙමළ මහ සෙනඟ" යන උධෘතයෙන් පැහැදිලි වෙයි (රෝහණදීර, 2011).

මෙම ආක්‍රමණය සිදු කිරීම සඳහා ලාංකේය ජනයාගේ උපකාරය ද ලබා ගෙන ඇති බව 'රටවැස්සන් වසඟ කොට හුන් දෙමළ ඈපාණන්' යන පාඨයෙන් ගම්‍යවන අතර "සොළී සෙනඟ මරා කිත්කිලිඟුනා අල්වා බැඳ..." යන පාඨයෙන් 'කිත් කිලිඟු නා' යනු දෙමළ ඈපාගේ නාමය ද නැතහොත් ආක්‍රමණයට සහය දුන් දේශීය නායකයෙකුගේ නාමය ද යන්න නිසියාකාරව ගම්‍ය නොවේ (රෝහණදීර, 2011).

මැන්දිස් රෝහණදීර මොහු දේශීය නායකයෙත් බව අනුමාන කරයි (රෝහණදීර, 2011). ඒ අනුව කිත් කිළිඟු නා මෙම ආක්‍රමණයට සහාය දුන් බව ප්‍රත්‍යක්ෂ වන අතර එමගින් තත් සමාජයෙහි සමාජ

අස්ථාවරත්වය ද පිළිබිඹු වෙයි. ඒ අනුව මෙවැනි පරිසරයක් තුළ සමාජ ප්‍රගමනය කෙරෙහි රජු ඇතුළු රාජ සභාව විශාල කැප කිරීමක් කළ බව පස් දවසක් පහන් වන්නට ප්‍රථම මෙම ආක්‍රමණය යථා තත්ත්වයට පත් කිරීමෙන් පැහැදිලි ය (රෝහණදීර, 2011).

යම් සමාජයක සමාජ වටිනාකම තීරණය වුණ සාධකයක් ලෙස අධ්‍යාපනය දැක්විය හැකි ය. ඒ අනුව පොළොන්නරු යුගයේ සන්නස් තුළින් ජනයාගේ සාක්ෂරතා ඥානය පිළිබඳව දුර්ලභ කරුණු ගණනාවක් අනාවරණය වෙයි. **පනාකඩුව තඹ සන්නස** සිත්තරු බිම් බුදල්නාවන්ට ලබා දුන්නකි. එය ලියා දිය යුතු බවට රජු "කිලිගු නාවිනී තාරා දෙටුන් මෙගම්හි නාවිනි තුන් දෙටුන්හට" (අමරවංශ හිමි, 1969) ප්‍රකාශ කළ නමුත් සන්නස් ලිවීම සඳහා වෙන ම නිලධාරියෙක් සිටි බව "ද්‍රවිඩ ලේඛකයාගේ පොතෙහි සහාය ව ලියන දෙව නැමැති මම වෙමි" (Ranawella, 2007) යන පාඨයෙන් පැහැදිලි වෙයි. ඒ අනුව මෙම සන්නස ලේඛනගත කොට ඇත්තේ 'දෙව' නමැති පුද්ගලයෙකි. එමෙන් ම නිශ්ශංකමල්ල රජුගේ අල්ලයි තඹ සන්නසෙහි "පාමුල් පෙට්ටියේ ලියන්නවුන්" (Fernando, 1978) පිළිබඳව සඳහන් කිරීමෙන් එකල තිබූ සාක්ෂරතාව පිළිබඳ විවිධ සාක්ෂ්‍යය හෙළි වෙයි. මෙලෙස සන්නස්වලින් හෙළි වන්නා වූ පොළොන්නරු යුගයේ සාක්ෂරතා මට්ටම ද සමාජ යහපැවැත්මට බලපාන්නා වූ තවත් එක් සමාජීය සාධකයකි.

මීට අමතරව සන්නස්වලින් විද්‍යමාන වන්නා වූ විශේෂ ලක්ෂණයක් නම් එකල මිනුම් ක්‍රම පිළිබඳවයි. ඉඩම් වෙන් කිරීම සඳහා 'යාල' නමැති මිනුම් ඒකකය භාවිත කිරීම වැදගත් කරුණකි. එය සන්නස්වල සඳහන් වන "මුල් බිජුවට යාලකට එල්ල පැදුම් දිගින්, මුල් බිජුවට සතර යාළ සතරමුණෙකින්, මුල් බිජුවට සතර යාලක්" (Ranawella, G. S, 2007) යනාදි පාඨවලින් පැහැදිලි වන අතර මෙකල ඉඩම් (පමුණු) ප්‍රදානය කිරීමේ දී 'යාල' නම් මිනුම් ඒකකය භාවිත කරමින් පමුණු ප්‍රදානය කර ඇති බවට ද සාධක හමුවෙයි. යාල නම් මිණුම් ඒකකය මනිනුයේ බිත්තර වී ඇසුරු කර ගනිමින් ය. යාලකට බිත්තර වී කරත්තයක් අන්තර්ගත ය. එමෙන් ම සන්නස්වලින් පැහැදිලි වන්නා වූ තවත් මිනිත ක්‍රමයක් වන්නේ 'අමුණු' නම් මිනිත ක්‍රමයයි. එය ද විවිධ භාණ්ඩ පරිහරණයේ දී භාවිත කර ඇත.

පනාකඩුව සන්නසට අනුව තව ද සමාජීය සාධකයක් ලෙස "සත් ළැගු සත් විසි වන්නෙහි කැත්තේ සඳ අව වප්මස්හි අව සතවත් දවස් නුරු පුරවෙරෙහි සිහසිනරා කිරුළු මිණි රසින්" (Ranawella, G. S, 2007) යන පාඨයෙහි ගැබ්වන්නා වූ අර්ථය හැඳින්විය හැකි ය. මෙහි එකල පැවති නැකත් ශාස්ත්‍රය සහ උත්සව අවස්ථා පිළිබඳව තොරතුරු විවරණය වෙයි. සන්නස් තුළින් විද්‍යමාන වන්නා වූ අභිෂේක උත්සවය වනාහි සමාජගතව පැවති ප්‍රබල උත්සවයකි. එමෙන් ම පමුණු ප්‍රදානය තුන් දා ගෙදර අභිෂේක මණ්ඩපයේ දී රාජ සභාව සම්මුඛව සන්නස් ප්‍රදානෝත්සවය ද උත්සවශ්‍රීයෙන් සිදු කළ බව පැහැදිලි ය (Ranawella, 2007, රෝහණධීර, 2011).

එමෙන් ම පාත්‍ර ධාතූන් වහන්සේලාට තෙල් ලබා දිය යුතු බව බොහෝ සන්නස්වල සඳහන් වීමෙන් ම පහන් පූජාව ද විශේෂ පූජා ක්‍රමයක් ලෙස දැක්විය හැකි ය. අල්ලයි සන්නසෙහි සඳහන් වන "බිජුවට යාලක් හැල් පැල් පෙරළ කුසලාන් වැලි කොඳු නිය පේළිය ඇතුළු" (Fernando, 1978) ආදි පාඨයට අනුව පමුණු ප්‍රදානය කිරීමේ දී ධාන්‍ය තැන්පත් කිරීම සඳහා නිර්මාණය කළ ස්ථාන, පෙර පින් පිණිස වෙන් කරන ලද ඉඩම්, අඩිපාරවල් සහා නින්දගම් යන ස්ථාන අතහැර පමුණු ප්‍රදානය සිදු කරවීම විශේෂ ලක්ෂණයකි. එතුළින් සමාජ සහයෝගීතාවය වර්ධනය වන අතර සමාජ ගැටුම් ඇතිවීමේ ඉඩකඩ සීමා වෙයි.

තවද සන්නස්වලින් ප්‍රතීත දේශපාලනික ව්‍යුහය පිළිබඳ විමසා බැලීමේ දී ඓතිහාසික මූලාශ්‍රයන්ගෙන් හෙළි නොවන තොරතුරු රැසක් හඳුනාගත හැකි ය. ලාංකේය දේශපාලනික ප්‍රපංචයෙහි සුවිශේෂ සන්ධිස්ථානයක් ලෙස පොළොන්නරු යුගයේ දේශපාලන ක්‍රමය වැදගත් රාජ්‍ය පාලනය කළ ආරම්භක රජ පරම්පරාවේ සිට අවසානය තෙක් රාජ්‍යත්වය දැරූ රජවරුන් පිළිබඳ තතු පොළොන්නරු යුගයේ සන්නස්වලින් හෙළිවන අතර මෙම දේශපාලන ක්‍රමය රාජාණ්ඩු ක්‍රමයක් මත ගොඩ නැගී ඇති බව ද පැහැදිලි ය. ඒ අනුව පොළොන්නරු යුගයේ ප්‍රථම රාජ්‍ය පාලකයා වූ I විජයබාහු රජු (ක්‍රි. ව. 1058-1114) පිළිබඳ පනාකඩුව සන්නස සඳහන් වන්නේ "සිරිසඟබො විජයබාහු රජපා වහන්සෙ තුමා" (Ranawella, 2007) ආදි ලෙස ය.

ද්‍රවිඩ ආක්‍රමණයන්ගෙන් රට මුදවා ගනිමින් රාජ්‍ය එක් සේසත් කිරීමෙහි ලා මහඟු මෙහෙයක් සිදු කළ රාජ්‍ය පාලකයෙකු ලෙස

පනාකඩුව සන්නසෙහි විජයබාහු රජු පිළිබඳව සඳහන් වෙයි. විජයබාහු රාජ්‍ය සමයෙන් අනතුරුව II පරාක්‍රමබාහු රාජ්‍ය සමය පිළිබඳව තොරතුරු සන්නස් තුළ සංගෘහීත නොවුණ ද තත් යුගයෙහි ප්‍රකට රජ කෙනෙකු වූ නිශ්ශංකමල්ල රජු පිළිබඳ දේශපාලන සාධක **අල්ලයි** සහ **දොරටියාව** යන සන්නස් මගින්, "සක්විති නිශ්ශංකමල්ල නිෂ්කළංක කාලිඟ පරාක්‍රමබාහු චක්‍රවර්තී සවාමින් වහන්සෙ" (Fernando, 1978), "සක්විති නිශ්ශංකමල්ල නිෂ්කලංක කාලිඟ පරාක්‍රමබාහු" (Ranawella, 2007) යනාදි වශයෙන් විවරණය වෙයි.

මෙම සන්නසද්වයෙහි දැක්වෙන පරිදි නිශ්ශංකමල්ල ක්‍රි. ව. 1887-1196 රජු ශ්‍රේෂ්ඨ රාජ්‍ය පාලකයෙකු බවත්, රට වැසියන්ගේ හිත සුව පිණිස හේතුවන්නා වූ විවිධ කර්තව්‍යයන් සිදු කරමින් සිය පාලනය ගෙන ගිය බවත් පැහැදිලි ය.

මීට අමතරව එකී සන්නස් තුළ යුවරජ පිළිබඳ තොරතුරු ද විවරණය වෙයි. නිශ්ශංකමල්ල රජුගේ නීත්‍යනුකූල පුත්‍රයා වූයේ I වීරබාහු බව සන්නසෙහි සුපැහැදිලිව පෙන්වා දෙයි. රජුගේ ලේ ඥාතීත්වය ඔහු සතුව ඇති හෙයින් ද, ලංකේය රාජ පරම්පරාවේ ඊළඟ උරුමක්කරු ඔහු වන හෙයින් ද, වීරබාහු යන නාමය පිළිබඳවත්, යුවරාජ සංකල්පයත් ක්‍රමිකව සමාජගත කළ අයුරු මෙමගින් පැහැදිලි වෙයි. එය නිශ්ශංකමල්ල රජුගේ බොහෝ සෙල්ලිපිවල ද සංගෘහීත වීමෙන් පැහැදිලි වන්නේ රාජ්‍යත්වය උරුම කර ගැනීමට පෙර යුව රජු විම අනිවාර්යය අංගයක් වූ බවයි (Wickramasinghe Vol II, 1928). නිශ්ශංකමල්ල රජුගේ ඇවෑමෙන් ඔහුගේ පුත්‍රයකු ලෙස හැඳින්වෙන වීරබාහු රජ විය (ලියනගමගේ, 1989). අනතුරුව වීරබාහු කුමරු නිශ්ශංකමල්ල රජුගේ 'නොසමාන දරු වූ බැවින් තාවුරු සෙනවිරත් විසින් ඔහු මරා දමන්නට යෙදුන' බව පූජාවලියෙහි දැක්වෙයි (ඤාණවිමල හිමි, 1997). ක්‍රි. ව. 1196 දී බලයට වු 'වික්‍රමබාහුගේ එරපාත' නම් තැනැත්තාගෙන් අනතුරුව රාජ්‍යත්වයට පත් වූ 'චෝඩ ගංග' නම් නිශ්ශංකමල්ල රජුගේ බෑනා කෙනෙකු පිළිබඳව බමුණාගල තඹ සන්නසෙන් පැහැදිලි වන්නේ මෙසේ ය.

> ..පබඳ ඇති අණසක්විති චෝඩ ගඟ චක්‍රවර්තී ස්වාමීන් වහන්සේ (රෝහණධීර, 2011).

ඒ අනුව පොළොන්නරු යුගයෙහි අවසන් භාගයෙහි රාජ්‍යත්‍වයට පත් වූ චෝඩ ගංග රජු පිළිබඳ ඓතිහාසික වශයෙන් හමුවන තොරතුරු විරල ය. මහාවංශයෙහි ද ඔහුගේ නාමය හැර කිසිදු තොරතුරක් සඳහන් කර නොමැත. පොළොන්නරු යුගයට අයත් මෑත කාලයෙහි හමු වූ **බමුණාගල තඹ සන්නස** තුළින් එකී අඩුව යම්තාක් දුරට සපුරාලයි. ඒ අනුව පොළොන්නරු යුගයට අයත් සන්නස් තුළින් තත් යුගයෙහි රාජ පරම්පරාව පිළිබඳව නිවැරදි දේශපාලන සාක්ෂ්‍යය ලබාගත හැකි ය.

මීට අමතරව අතීත ශ්‍රී ලාංකේය සමාජයෙහි දේශපාලන ප්‍රපංචය තුළ දක්නට ලැබුණු රාජ්‍යත්වයට පත්වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් රැසක් පිළිබඳ පොළොන්නරු යුගයේ සන්නස් තුළින් ස්ඵුට වෙයි.

> ස්වස්ති සිරිවත් අපරියත් ලො ඉකුත් ගුණ මුළෙන් උතුරත් මුළු දම්බදිව්හි අන් කැත් කුල පාමිලි කළ ඔකාවස් රජ පරපුරෙන් බට කැත් උසබනට අග මෙහෙසුන් වූ ලක්දිව් පොළො යොහෙන පරපුරෙන් හිමි සිරිසඟබෝ විජයබාහු. (Ranawella, 2007).

උක්ත පාඨයට අනුව රාජ්‍යත්‍වය සඳහා අවශ්‍ය සුදුසුකම් ගම්‍යවන අතර මෙහි දී ඊශ්වර නිර්මාණවාදී සංකල්පය ඇසුරු කර ගනිමින් රාජ්‍ය සංකල්ප බිහි වී ඇත. ඒ අනුව රාජ්‍ය පාලකයා ක්‍ෂත්‍රිය වංශයකයෙකු වීම අවශ්‍ය ම ලක්‍ෂණයකි. එම සංකල්පය ලාංකේය දේශපාලන ප්‍රපංචය තුළ ද දක්නට ලැබුණු බව "ලො ඉකුත් ගුණ මුලෙන් උතුරත් මුළු දඹ දිව්වෙනි අන් කුල පාමිලි කළ..." (රෝහණධීර, 2011) යන පාඨයෙන් ප්‍රත්‍යක්‍ෂ වෙයි. ඒ අනුව පාරිශුද්ධත්‍වයෙන් යුක්ත රාජ්‍ය නායකයෙකු වීම සඳහා එය අවශ්‍ය අංගයක් බවත්, භාරතයේ උසස් වූත්, ප්‍රෞඪත්‍වයෙන් යුක්ත වූත්, රාජවංශයක් වන ඔක්කාක රාජවංශිකයෙකු වීම ද තවත් එක් දේශපාලන සාධකයකි. පොළොන්නරු යුගයේ සන්නස්වලින් විද්‍යමාන වන රාජ්‍යත්‍වයට පත් වීම සඳහා අවශ්‍ය වන්නා වූ තවත් සුදුසුකමක් වන්නේ "කැත් ඔසබනට අග මෙහෙසුන් වූ" යනාදි වශයෙන් සඳහන් කෙරෙන ක්‍ෂත්‍රීය අගමෙහෙසියකගේ කුසෙහි පිළිසිඳ ගැනීමයි. එමෙන් ම "යුවරජව

සිටි උරෙයිදා වීරබාහු මහපාණන්," (Ranawella, 2007) හිවරජ අන්ණා මපණන් වහ(න්)සෙ" (රෝහණධීර, 2011) ආදි වශයෙන් ඈපා, මාපා, යුවරජ ආදි තනතුරු දැරීම ද සපුරාලිය යුතු තවත් එක් සුදුසුකමකි.

යුවරජ යනු දේශපාලන ප්‍රපංචයෙහි ඊළඟ නියමුවා ය. ඒ අනුව රාජ්‍යත්වයට පත්වීමට ප්‍රථම යුවරජ ආදි තනතුරු දැරීම එකල අත්‍යවශ්‍ය දේශපාලන අංගයක් විය. නිශ්ශංකමල්ල රජු විදේශීය රජ කෙනෙකු වුව ද, රජයේ ඈපා මාපා තනතුරු රජ ඉසුරු විඳිමින් ඉක්බිතිව සිංහාසනයට පත් වූ බව සන්නස්හි ආඩම්බරයෙන් සඳහන් කර ඇත. පොළොන්නරු යුගයේ සන්නස්හි දක්නට ලැබෙන පාඨයන්ට අනුව රාජාභිෂේකය වනාහි රාජ්‍යත්වයට පත් වීමට සපුරාලිය යුතු ප්‍රධාන අංගයක් බව ප්‍රත්‍යක්ෂ වෙයි. මහාවංශයෙහි 'කීර්ති නිශ්ශංක නම් ක්ෂත්‍රීය තෙම රාජ්‍ය රාජාභිෂේකයට පැමිණ පුලස්ථි පුරවරයෙහි රම්‍ය වූ ශෛලමය රන් ධාතු බඳවා...' (මහාවංශය, 2006) වශයෙන් නිශ්ශංකමල්ල රජුගේ රාජාභිෂේකය බෞද්ධ ආගමට අනුකූලව සිදු කළ බව සඳහන් ය. ඒ අනුව කාලිංග වංශික රජවරුන්ට පවා දළදා පාත්‍ර ධාතුන් වහන්සේලාට තෙල් ලබා දෙමින් ධර්මානුකූලව දසරාජ ධර්මයට ගරු කරමින් රට පාලනය කළ බව පොළොන්නරු යුගයේ සන්නස් තවදුරටත් සාක්ෂ්‍යය දරයි. ඒ අනුව සන්නස්වලින් පැහැදිලි වන පරිදි රාජ්‍යත්වය සඳහා සපුරාලිය යුතු ප්‍රධාන සුදුසුකම් මෙසේ පෙන්වා දිය හැකි ය.

පොළොන්නරු යුගයේ සන්නස්වලින් හෙළිවන පරිදි තත් දේශපාලන ප්‍රපංචය තුළ රාජ්‍යත්වයට පත් වූ රජවරුන් අන්වර්ථ නාම හෙවත් ගෞරවාර්ථ නාම රැසක් භාවිත කර ඇත. එය ද වැදගත් දේශපාලන සාධකයකි. එයට හේතුව ලෙස ලක්දිව අභිෂේක මංගල්‍යය නම් කෘතියෙහි දැක්වෙන්නේ බලපරාක්‍රමයෙන් හීන වූ රජවරුන් සිය පෞද්ගලික නාමය සඳහා විවිධ ගෞරව උපාධි භාවිත කොට ඒකරාජ ලීලාවෙන් වැජඹුණ බවයි (චන්‍ද්‍රසිරි හිමි, 2007). පොළොන්නරු යුගයේ චෝළ ආක්‍රමණයන් නිසා විවිධ අපහසුතාවලට මුහුණ දීමට සිදු වූ යුගයකි. I විජයබාහු රජු පවා අන්වර්ථ නාමයන් භාවිත කර සිය රාජ්‍ය පාලනය සිදු කළ අන්දම 'සිරිසඟබෝ විජයබාහු' ලෙස පනාකඩුව තඹ සන්නසෙහි තමා හඳුන්වා ඇති අන්දමින් එය පැහැදිලි වේ. සිරිසඟබෝ යන උපාධි නාමයෙන් පූර්ව කාලීන දේශපාලන ප්‍රපංචය තුළ භාවිත කර ඇති උපාධි නාමයකි. මෙය වනාහි ලක්දිව

රජවරුන් නමවන සියවසේ සිට අබාසලමෙවන් යන නාමය සමඟ මාරුවෙන් මාරු බැවහර කළ විරුද නාමයක් බව මැන්දිස් රෝහණදීර පෙන්වා දෙයි (රෝහණදීර, 1998). ඒ අනුව **පනාකඩුව තඹ සන්නසෙහි** රාජ්‍ය නාමය හැඳින්වීම සඳහා උක්ත පරිදි සිරිසඟබෝ විජයබාහු යන භාවිත කර ඇති අතර මෙම උපාධි නාමය නිශ්ශංකමල්ල රජු ඇතුළු රජවරුන් බොහෝ දෙනෙක් භාවිත කර ඇති බවටත් ඔවුන්ගේ අභිලේඛන මඟින් සාක්ෂ්‍යය හෙළි වෙයි. මෙම යුගයට අයත් අල්ලයි සහ දොරටියාව සන්නස් තුළ ද නිශ්ශංකමල්ල රජු භාවිත කළ විරුදාවලි පිළිබඳව සඳහන් වෙයි. "අණ සක්විති නිශ්ශංකමල්ල නිෂ්කළංක කලිඟ පරාක්‍රමබාහු චක්‍රවර්‍තති, වීරරාජ නිශ්ශංකමල්ල" (Ranawella, 2007) යන පරිදි මෙම සන්නස්වලට අනුව අණ සක්විති, නිශ්ශංකමල්ල, කලිඟ, පරාක්‍රමබාහු, චක්‍රවර්ති, වීරරාජ, යන විරුදාවලියෙන් යොදාගත් බව පැහැදිලි වෙයි.

අණසක්විති යන ගෞරව නාමය පිළිබඳව විමසීමේ දී පොළොන්නරු යුගයේ මුල් අවධියේ එවැනි නාමයක් පිළිබඳව සඳහන් නොවන බව මහා විජයබාහු රජුගේ අඹගමුව සෙල් ලිපිය, පනාකඩුව තඹ සන්නස වැනි ලිපි තුළින් ද ප්‍රත්‍යක්ෂ වෙයි (Wickramasinghe, Vol. II, 1928). නමුත් විජයබාහු රජුගේ මරණයෙන් අනතුරුව පිහිටුවූවා යැයි සිතිය හැකි පොළොන්නරුවෙහි වේලයික්කාර ද්‍රවිඩ ලිපියෙහි පමණක් 'චක්‍රවර්තිකල් ශ්‍රී විජයබාහු දෙවර්' (Wickramasinghe, Vol. II, 1928) ලෙස සඳහන් වන අතර එය බුදුමුත්තාව දෙමළ ලිපියේ (Wickramasinghe, Vol. III, 1933) ද සඳහන් වෙයි. ඒ අනුව පැහැදිලි වන්නේ I විජයබාහු රජුගෙන් පසු කාලයෙහි මෙම උපාධි නාමය රාජ්‍ය පාලකයන් භාවිත කළ බවත්, මෙය දකුණු ඉන්දීය චෝළ රජවරුන්ගෙන් ලැබුණු බවත් ය. පසුව II ගජබාහු 'අණ සක්විති' (**J. C. B. R. A. S.** XXVI, 1925) යන විරුදය බැවහර කොට ඇති අතර මහා පරාක්‍රමබාහු රජුගේ ගල් විහාර ලිපියේ තමා 'ආඥා චක්‍රවර්ති' (Wickramasinghe, Vol. II, 1928) යනුවෙන් හඳුන්වා තිබේ. මෙහි 'ආඥා' හෝ 'අණ' යන 'අධික පදය' කිසි විශේෂ අර්ථයක් සඳහා යෙදී ඇත්තේදැයි පැහැදිලි නැත. (රෝහණදීර, 1998) මීට අමතරව පොළොන්නරු යුගයෙහි සන්නසක් වන බමුණාගල තඹ සන්නසෙහි ද 'අණ සක්විති චෝඩ ගඟ චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ' යන්න සඳහන් වීමෙන් පැහැදිලි වන්නේ චෝඩ ගඟ රජු ද මෙම

උපාධි නාමය භාවිත කර ඇති බවයි. 'නිශ්ශංකමල්ල' යන විරුද නාමය පිළිබඳ විමසා බැලීමේ දී මෙම විරුද නාමය **අල්ලයි** තඹ සන්නස සහ **දොරටියාව** සන්නසෙහි අන්තර්ගත වන අතර මෙම රජුගේ සංඥා නාමයක් ලෙස යොදා ගත්තකි. මෙය පිළිබඳව තවදුරටත් විමසීමේ දී එය රජුගේ සංඥා නාමය බවට සැකයක් නොමැත. නිශ්ශංකමල්ල රජු 'කලිඟ' අන්වර්ත නාමය බොහෝ සෙයින් භාවිත කර ඇති බව සන්නස්වලින් මෙන් ම සෙල්ලිපිවලින් ද විද්‍යමාන වෙයි. ඒ අනුව කාලිංග යන්න ඔහුගේ ජන්ම භූමියේ නාමය ලෙස භාවිත කර ඇත. එහි පරාක්‍රමබාහු 'ලංකේශ්වර චක්‍රවර්ති' යන උපාධි නාමය ම සමඟ ද භාවිත කර ඇති බවක් හඳුනාගත හැකි ය. මෙම උපාධි නාමය 'කාලිංග ලංකේෂ' යනුවෙන් සිය කාසිවල යොදා ඇති අතර 'කළිඟු ලකිඳු' යි ගල්පොත ලිපිය සහ පොළොන්නරුව වාන් ඇළ ලිපියේ යොදා ඇත. මීට අමතරව නිශ්ශංකමල්ල රජු භාවිත කළ තව ද උපාධි නාමයක් වන්නේ 'පරාක්‍රමබාහු' යන උපාධි නාමයයි. මේ ආදි ලෙස පොළොන්නරු යුගයෙහි රජවරුන් භාවිත කළ දේශපාලන ප්‍රයෝගයක් වන අන්වර්ථ නාම භාවිතය පිළිබඳව විවරණය කළ හැකි ය.

ඒ අනුව පොළොන්නරු යුගයෙහි රාජාණ්ඩු පාලන ක්‍රමයක් තිබු හෙයින් ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ සියලු ම බලතල හිමි වූයේ රාජ්‍ය පාලකයා වූ රජු වෙත ය. රාජ්‍ය පාලකයාට ඒකාධිපති බලයක් හිමි වූ අතර ඔහුගේ සහාය සඳහාත්, පාලන තන්ත්‍රය මෙහෙයවීම සඳහාත්, රාජ සභාව ලෙස උපදේශන මණ්ඩලයක් සිටි බව පනාකඩුව, අල්ලයි, දොරටියාව, බමුණාගල යන සන්නස්වලින් මෙන් ම වෙනත් අභිලේඛන, සාහිත්‍ය මූලාශ්‍රයවලින් ද පැහැදිලි වෙයි.

එහි දී සිත්තරුබිම් බුදල්නාවන්ට පමුණු ප්‍රදානය කිරීමේ දී 'ඈපා මායා යුවරජ ඈ රජගණා' (E. Z, 1963) ඉදිරියේ එම ප්‍රදානය සිදු කළ බව පනාකඩුව තඹ සන්නසෙහි අන්තර්ගත වෙයි. මෙහි 'රජ ගණා' යනු රාජකීය සමූහයා යන තේරුම නොව 'රජුගේ සභාව' යන අර්ථය බව පරණවිතාන අදහස් කරයි. මෙම ඇමති ගණා පිළිබඳව සඳහන් කර ඇති ලේඛන ලෙස දැනට හමු වී ඇත්තේ **අල්ලයි සන්නස**, **දොරටියාව සන්නස** යන සන්නස් ය. මේවායෙන් 'ඇමති' ගණ හෙවත් රාජ්‍ය සභාවට ඇතුළත් වූ ප්‍රධාන නිලධාරීන්

පිළිබඳ තොරතුරු හෙළිවෙයි. මෙම සන්නස්වල ඇමති ගණාට ඇතුළත් වූ පිරිස ලෙස අගබිසොව, දෙවන බිසව, යුවරජ, සෙනවිරත්, අධිකාරිවරුන් තිදෙනෙක්, සහ සභාපති නා, දහම්බඩහැලි නා ආදින් බව පහත නිදසුනෙන් අවබෝධ වෙයි.

> අග්‍රමහේෂිකාව වූ සුභද්‍ර මහදේවි වහන්සේ සහ කල්‍යාණ මහා දේවීන් වහන්සේ සහ යුවරජ වි සිටි රාජකීය උරුමකරුවෙකු හෙවත් එතුමියගේ කුසින් බිහි කළා වූ වීරබාහු මහා පාණන් වහන්සේ හා ලක් විජයසිඟු සෙනවි තාවුරුනාවන් හා ලංකා අධිකාර ලොලු පැලෑකුළු කිතල්නාවන් හා අධිකාර තොටදනවු සුව නාවන් හා අධිකාර තොටදනවු සාතානාවන් හා සභාපතිනායක දහම්බඩහැලි ගජබාහුනාවන් ඇතුළු වූ ඇමැතිගණ පිරිවරා. (Fernando, 1978).

ඒ අනුව **පනාකඩුව සන්නසේ** සඳහන් වන ‘රජ ගණා’ යන පදය **අල්ලයි, දෙරටියාව** යන සන්නස්හි සඳහන් වන ‘ඇමති ගණා’ යන පදය රජුගේ රාජ සභාව යන අදහස ලබා දෙන වචනාර්ථයන් බව පෙන්වා දිය යුතු ය. මෙම රාජ සභාව තිබුණු ස්ථානය පිළිබඳව නිශ්චිතව තොරතුරු අනාවරණය නොවන අතර සියලු ම පමුණු ප්‍රදානයන් සිදු කරනුයේ තුන්දා ගෙදොරැ අභිෂේක මණ්ඩලය (Fernando, 1978) ඉදිරිපිට ය. එහෙත් මේ පුරාවිද්‍යාත්මකව නිශ්ශංකමල්ල රජුගේ මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලේ නටඹුන් හඳුනා ගැනමෙන් (Wickramasinghe, 1912) තුන්දා ගෙදොරැ අභිෂේක මණ්ඩලය ද රාජ්‍ය සභාව අසල තිබුණු බව අනුමාන කළ හැකි ය.

රාජ සභාවෙහි බලය ඈපා, මාපා, යුවරජ ලෙස ප්‍රධාන වශයෙන් බලය බෙදී ගොස් ඇත. මෙහි ඈපා තනතුර ලබා දෙන්නේ රාජකීය පුත්‍රයාට ය. රජුට පුත්‍රයෙකු නැති වූ විට රජුගේ සොහොයුරා, බෑනා, මස්සිනා පිළිවෙළින් එම තනතුර දරයි (විමලකිත්ති හිමි, 2001). මාපා තනතුර පිළිබඳව විමසීමේ දී රජකෙනෙකුට පුතුන් කිහිපදෙනෙකු ඇති විට එහි වැඩිමහලා මාපා ලෙස හඳුන්වා ඇත. මෙකල යුවරජ යන තනතුර ප්‍රධාන තනතුරක් වන්නේ රජයේ මීළඟ උරුමක්කරු යුව රජ වන හෙයින් ය. ඒ අනුව රජුගේ පුත්‍රයාට ඈපා තනතුරු ලැබූ

අතර රජුගේ මලයාට හිමි වූයේ යුව රජ පදවියයි (විමලකිත්ති හිමි, 2001). මෙහි දී රජුගෙන් අනතුරුව විධායක බලතල යුව රජු සතු වූ අතර රාජ්‍යයේ ප්‍රධානතම වගකීම් මොහු සතු වු බව සන්නස් තුළින් පිළිබිඹු වෙයි.

ඒ අනුව නිශ්ශංකමල්ල රාජ්‍ය සමයෙහි යුවරජු ලෙස වීරබාහු නම් තැනැත්තෙක් සිටි බව **අල්ලයි** සහ **දොරටියාව සන්නස්**වලින් පිළිබිඹු වන අතර **බමුණාගල සන්නස** තුළින් චෝඩගංග රජුගේ කාලයේ අන්ණා මහපාණන් වහන්සේ' යුවරජ වූ බව පැහැදිලි ය. මූලාශ්‍රය තුළ පොළොන්නරු යුගයෙහි රාජ්‍ය මණ්ඩලය පිළිබඳ පැහැදිලිව සඳහන් නොවීම හේතුවෙන් ඒ පිළිබඳව පැහැදිලි විවරණයක් සිදු කිරීම අසීරු ය. එහෙත් පොළොන්නරුව සන්නස්වලින් මෙකී අමාත්‍ය මණ්ඩලය පිළිබඳ වැදගත් තොරතුරු රැසක් විවරණය වෙයි.

ඒ අනුව සෙනවිරදුන් රාජකීයයන් අනතුරුව සිටි උසස් නිලධරයා බව **දොරටියාව සන්නසින්** ද, (Ranawella, 2007) මන්ත්‍රණ සභා පැමිණිලිවලින් ද, පැහැදිලි වන අතර මෙම සෙනෙවිරදුන් අගමැති ලෙස හඳුන්වාදීම තුළින් ද අතිඋසස් බලයක් ඔවුන් සතු වූ බව සසදාවත අනුව පැහැදිලි ය. එමෙන් ම නිශ්ශංකමල්ල රජුගේ රාජ සභාව පිළිබඳව අල්ලයි සන්නස, දොරටියාව සන්නස සහ **බමුණාගල සන්නස** ආදි සන්නස්වලින් පිළිබිඹු වන්නා වූ තොරතුරු මෙලෙසින් විවරණය කළ හැකි ය.

> ලක්-විජයසිඟු සෙනවි තාවුරුනාවන් හා ලංකා අධිකාර ලොලු පැලෑකුළු කිතල්නාවන් හා අධිකාර තොටදනවු සාතානාවන් හා අධිකාර තොටදනවු සුව නාවන් හා සභාපතිනායක දහම්බඩහැලි ගජබාහුනාවන් ඇතුළු වූ ඇමැතිගණා පිරිවරා (Ranawella, 2007).

ඒ අනුව ලක්විජය සිඟු සෙනෙවි තාවුරු නාවන්, ලංකා අධිකාර ලොලු පැලෑකුළු කිතල් නාවන්, අධිකාර තොටදනව් සතා නාවන්, අධිකාර තොට දනව් සුවනාවන්, සභාපති නායක දහම් බඩහැලි ගජබාහු නාවන් යන අය අමාත්‍ය මණ්ඩලයෙහි නියෝජනය කළ පිරිස විය. මීට අමතරව අප්‍රකට සන්නසක් වූ **බමුණාගල තඹ සන්නස** තුළින් 'කළු අබෝනා' නම් තනතුරක් පිළිබඳව ද තොරතුරු හෙළි වෙයි.

මෙහි සඳහන් වන 'ලක් විජය සිඟු' යන්න ගෞරවනාමයක් බව පෙන්වා දිය හැකි ය. නිශ්ශංක මල්ල රජුගේ මරණයෙන් අනතුරුව රජ වූ ඔහුගේ පුත් වීරබාහුගේ මරණය සම්බන්ධව වගකිවයුත්තා 'තාවුරු සෙනෙවිරද්' නැමැත්තෙකු බව පූජාවලිය සඳහන් කරයි (පූජාවලිය, 1997). ඒ අනුව මෙකී අමාත්‍යවරයා නිශ්ශංකමල්ල රජුගේ සෙනෙවිරදුන් බව පිළිගැනීමේ හැකියාවක් පවතී. තවද තනතුරු ප්‍රදානයක් ලෙස 'ලක් විජය සිඟු' පෙන්වා දිය හැකි ය. මෙය අගමැති සෙනෙවිරත් යන තනතුරුද්වයට ම නියමිතව පටබැඳි නමක් බව මැන්දිස් රෝහණදීර සඳහන් කර ඇත (රෝහණදීර, 1998). මෙම තනතුර නිශ්ශංකමල්ල රාජ්‍ය කාලයේ දී අල්ලයි සහ දොරටියාව සන්නස් තුළ ලක්විජය සිඟු සෙනවිතාවුරු නාවන් ලෙස ද, චෝඩ ගංග රජුගේ කාලයේ මෙම අමාත්‍යවරයා ලක් විජය සිඟු සෙනෙවි රකල් නාවන් ලෙස ද දක්වයි (රෝහණදීර, 2011).

පොළොන්නරු යුගයේ සන්නස්වල දැක්වෙන අමාත්‍ය මණ්ඩලයේ නිලයන්ට අයත් සංඥා නාම ලෙස කලා නාවන්, රකල් නාවන්, සභාපති නා, දහම්බඩහැලි නා, අබෝ නා ආදි වශයෙන් දැකිය හැකි ය. නිශ්ශංකමල්ල අමාත්‍ය නොමැති දක්නට නොමැති චෝඩ ගංග රජුගේ අමාත්‍ය මණ්ඩලයේ ඇති අමාත්‍යවරයෙකු ලෙස 'කළු අබෝ නාවන්' මෙහි දී වැදගත් ය.

තත් යුගයේ සන්නස්වලින් විද්‍යමාන වන්නා වූ 'ලංකාධිකාර සහ අධිකාර' තනතුරු පිළිබඳ විමසා බැලීමේ දී පැහැදිලි වූ එක් කරුණක් වන්නේ අධිකාර තනතුරට වඩා ලංකාධිකාර තනතුර උසස් වූ බවයි. **අල්ලයි සන්නස්** ප්‍රකාශයට පත් කරන විට ලක්විජය සිඟු සෙනෙවි තවුරු නා ළඟට සඳහන් කරන්නේ ලංකාධිකාර ලොලු පාලැකුළු කිතල් නායක ය. **දොරටියාව සන්නසෙහි** ද එලෙස ය. (Ranawella, 2007) එහෙත් ඔහු එහි හඳුන්වන්නේ අධිකාර ලෙස ය. දොරටියාව පමුණුව දෙන්නේ ද මේ කිතල් නාවන්ට ය. එයට හේතුව වන්නේ ඔහු විජය මහා-පාය කරවූ දස්කමට ය. රජු රාජ ධූර විචාරා කළමනා ව්‍යවස්ථා වදාරන තැන පමුණු ප්‍රදානය ප්‍රකාශ කරන අවස්ථාවේ ඔහු හැඳින්වෙන්නේ 'ලෝලු පැලෑ කුළු කිතල් නා' යනුවෙන් ය (Ranawella, 2007). එමගින් පැහැදිලි වන්නේ ලංකාධිකාර තත්ත්වය අධිකාරි තත්ත්වයට වඩා උසස් බවයි.

පොළොන්නරු සන්නස්වල දැක්වෙන මෙකී අමාත්‍ය මණ්ඩලය පවුල් දෙක තුනකට සීමා වූ බව පැහැදිලි ය. මින් එක් පවුලක් නම් ලෝලු පැලෑ කුළු පවුලයි. **දොරටියාව සන්නසෙහි** සඳහන් පමුණු ලබා දෙන්නේ ද මෙම පවුලේ කෙනෙකුට ය. නිශ්ශංකමල්ල රජුගේ සහෝදරයා වූ සහසමල්ල මෙරටට ගෙන්වන්නට පත්‍ර යවන්නේ ද ලොලු පැලෑකුළු පවුලේ දෙදෙනෙකි. නිශ්ශංකමල්ල රජුගෙන් පසු පැවති අර්බුද සමයේ ලංකා දේශපාලන කටයුතු මුළුමනින් ම මෙහෙය වූ 'අබෝ නා' නම් තැනැත්තාට ද මෙකී පවුලට අයිති ය (රෝහණදීර, 1998). මීට සම්බන්ධ අනෙක් පවුල වන්නේ තොටදනවු පවුලයි. දොරටියාව උත්සවයේ දි තොට දනවු පවුලේ අය ද එයට සම්බන්ධ වූ බව දොරටියාව සන්නසෙන් පැහැදිලි වෙයි (රෝහණදීර, 2011).

මීට අමතරව පොළොන්නරු යුගයේ දී සිදු කළ අධිකරණ කටයුතු පිළිබඳව විමසා බැලීමේ දී ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ත්‍රිවිධ බලතල රජු වටා සංකේන්ද්‍රගත වී තිබුණු බව **පනාකඩුව, අල්ලයි, දොරටියා, බමුණාගල සන්නස්වලින්** හෙළිවෙයි. බදු නොගෙවූ අවස්ථාවන්හි ඒ සම්බන්ධව යුක්තිය පසිඳලීම සඳහා සිරගෙයි දැමීම, මරණීය දණ්ඩනය ලබා දීම, රටින් පිටුවහල් කිරීම, නිග්‍රහ කිරීම ආදිය **පනාකඩුව සන්නසෙහි** කැපී පෙනෙයි (අමරවංශ හිමි, 1969). එමෙන් ම **පනාකඩුව තඹ සන්නසට** අනුව අභයදානය ලබාදීම, තෙවරක් ක්ෂමා කිරීම වැනි දඬුවම් ලිහිල් කිරීමේ ක්‍රම ද දැකගත හැකි ය. එමෙන් ම චෝඩ ගංග රජුගේ බමුණාගල තඹ සන්නසෙහි 'සෙනඟ මරා කිත් කිලිගුනා අල්වා බැඳ' (රෝහණදීර, 2011) ආදි වශයෙන් විශේෂ දඬුවම් ක්‍රමයක් පිළිබඳව තොරතුරු විවරණය වෙයි.

පොළොන්නරු යුගය වනාහි විදේශීය ආක්‍රමණ රැසකට මුහුණ දීමට සිදු වූ යුගයකි. ප්‍රථම යුගය වූ අනුරාධපුර යුගයෙන් පොළොන්නරු යුගයට රාජධානිය මාරු කිරීමට සිදු වූයේ ද චෝළ ආක්‍රමණයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ය. එය **පනාකඩුව තඹ සන්නසෙහි** එන 'දෙමෙළ බල මුළු අන්දුරු දුරු ලා, අප සොළී දෙමළුන්ගෙ විබලයෙන්" (අමරවංශ හිමි, 1969) යන පාඨයන් තුළින් අවබෝධ කරගත හැකි ය. මෙම ආක්‍රමණයෙහි භයංකාරත්වය කෙසේද යත්: කිත්ති කුමරු ඇතුළු සිය පවුලට සිදුවූයේ වනගත වී වන මුල්

ඵලාහාරවලින් ජීවිතය රැක ගැනීමට ය. සන්නසෙහි එන "පා තැබූ තැබූ තන්හි සොයමින් හැසිරෙන සතුරන් කෙරෙන් වලකා" (අමරවංශ හිමි, 1969) යන පාඨය තුළින් ද ඒ තවදුරටත් ප්‍රත්‍යක්‍ෂ වෙයි. පොළොන්නරු යුගයෙහි අගභාගයට අයත් සන්නසක් වන බමුණාගල සන්නසෙන් ද සොළී ආක්‍රමණයක් පිළිබඳව තොරතුරු හෙළිවෙයි (රෝහණදීර, 2011).

චෝඩ ගංග රජු පිළිබඳව ඓතිහාසික කරුණු මදභාවය හේතුවෙන් මෙම කාලයෙහි සමාජ කරුණු අවබෝධ කර ගැනීමෙහි ලා බමුණාගල සන්නස සුවිශේෂ මූලාශ්‍රයකි. ඒ අනුව චෝඩ ගංග රාජ්‍ය කාලයේ සිදු වූ මෙම ආක්‍රමණය පිළිබඳ මෙතෙක් කිසිදු මූලාශ්‍රයක සඳහන්ව නැත. මෙම ඓතිහාසික සිද්ධාන්තය "සොළී රටැ සිටැ සිවුරඟැ සෙනඟ පිරිවරා මාවුටු තොට සිල්ලමට පාරු පිටින් බැසැ මාවුටු තොටය පැහැරැ සොළී මහ සෙනඟ ගෙන" (රෝහණදීර, 2011) යන්න බමුණාගල තඹ සන්නසේ සඳහන් වෙයි. ඒ අනුව මෙකල යුව රජ ව සිටි 'අන්ණා මහා පාණන්' මෙම දෙමළ ආක්‍රමණය පස් දවස පාන් වන්නට දෙපැයක් තිබිය දී මර්දනය කළ බවක් තවදුරටත් එම සන්නසෙහි අන්තර්ගත වෙයි. මේ ආදි ලෙස පොළොන්නරුව සන්නස් තුළ විදේශීය ආක්‍රමණ දෙකක් පිළිබඳව තොරතුරු සඳහන් වෙයි.

පොළොන්නරු යුගයේ සන්නස්වලින් විද්‍යමානවන ආර්ථික තොරතුරු පිළිබඳ විමසා බැලීමේ දී බමුණාගල සන්නස ප්‍රධාන වෙයි. එයට අනුව වෙනත් මූලාශ්‍රයක සඳහන් නොවන මුදල් ඒකකයක් පිළිබඳව තොරතුරු විවරණය වෙයි. පොළොන්නරු යුගයේ අර්ථ ක්‍රමය ප්‍රධාන වශයෙන් ම නිර්මාණය වූයේ බඳු ප්‍රතිපත්ති ක්‍රමවේදය ප්‍රමුඛ කර ගනිමින් ය. ඒ අනුව බමුණාගල තඹ සන්නසෙහි, " රන්මැළි රන් පොළියක් නොගන්නා ඉසා" (රෝහණදීර, 2011) යන්න අනුව 'රන්මැළි' ලෙස මුදල් හෝ බඳු හැඳින්වීම සඳහා යොදා ගත් නාමයක් ද යන්න පැහැදිලි නොවන අතර එවැනි ඒකකයක් පිළිබඳව පොළොන්නරුවෙහි කිසිදු අභිලේඛනයකින් හමු නොවේ. ඒ අනුව 'රන් මැළි' යනු රත්තරන්වලින් නිර්මාණය කරන ලද මුදල් ඒකකයක් විය හැකි බවත්, 'රන් පොළියක්' ලෙස හඳුන්වා ඇත්තේ එළහරක් මීහරක් සම්බන්ධයෙන් අය කළ පොළිය බවත් නිගමනය කළ හැකි ය.

මෙය පොළොන්නරු යුගයෙහි ආර්ථික සාධකයක විවරණය කිරීමට උපකාරී වන්නා වූ නව්‍ය තොරතුරකි.

බමුණාගල සන්නසෙහි "පො(දෙ)ල් පුවක් උක් රැබ් අරබ්..." ආදි වශයෙන් සඳහන් වන පරිදි පොළොන්නරු යුගයේ ගොඩ ගොවිතැන ද මහා පරිමාණයෙන් මඩ ගොවිතැන ද සිදු කළ බව පොළොන්නරු යුගයේ සන්නස් තුළින් පිළිබිඹු වෙයි. මීට අමතරව පොළොන්නරු යුගයෙහි මඩ ගොවිතැනෙහි ප්‍රධානතම ධාන්‍ය වර්ගය වී ඇත්තේ 'ශාලි ධාන්‍ය' හෙවත් 'බිත්තර වී' වන අතර එය නිශ්ශංකමල්ල රජුගේ **අල්ලයි තඹ සන්නස, දොරටියාව සන්නස,** චෝඩගංග රජුගේ **බමුණාගල තඹ සන්නස** මගින් ද එය ප්‍රකට වෙයි. එයට උදාහරණ පහත දැක්වේ.

මුල් බිජුවට යාලක් පමුණු කොටැ දෙන්නෙ යි (Ranawella, 2007).

පමුණු කොට බිජුවට තුන් යාළක් (Ranawella, 2007).

බිජුවට තුන් යාළක් ඇතුළු වැ (රෝහණදීර, 2011).

එමෙන් ම අර්ථ ක්‍රමය වර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ සුබසාධන සේවාවන්හි එක් අංගයක් වන ගමනාගමන පහසුකම් පිළිබඳව තොරතුරු සන්නස්හි සංගෘහීත ය. ඒ අනුව **බමුණාගල තඹ සන්නසෙහි**, "මාවුටුතොට සිල්ලමට පාරු පිටින් බැසැ මාවුටුතොටය පැහැරැ" (රෝහණදීර, 2011) යනාදි වශයෙන් දැක්වෙන අතර එතුළින් පැහැදිලි වන්නේ නාවික ගමනාගමන පහසුකම් මෙකල සමාජයෙහි තිබුණු බවත්, ඒවා දීප ව්‍යාප්ත මට්ටමෙන් පැවති බවත් ය.

මීට අමතරව පොළොන්නරු යුගයෙහි සන්නස් තුළින් ඉතාම අප්‍රකට වූත් සුවිශේෂවූත් බෞද්ධ ආගමික සාධකයක් පිළිබඳව තතු හෙළි වෙයි. එය වූ කලී තුන් ධාතු මන්දිරයයි. 'තුන් දා ගෙදෙරැ' වනාහි රාජ්‍ය නායකයාගේ බෞද්ධත්වය පිළිබිඹු කරන්නා වූ ප්‍රතිමූර්තියයි. ඒ පිළිබඳව ප්‍රත්‍යක්ෂ වන්නේ අභිෂේක මංගල්‍ය ඇතුළු රාජ සභාවේ සියලු ම විධිවිධානයන් සිදු කරනු ලබන්නේ මෙම තුන් දා ගෙදෙරැ අභිෂේක මණ්ඩපය ඉදිරියේ වීම නිසා ය. ඓතිහාසික මූලාශ්‍රයානුගත විමසා බැලීමේ දී තුන් ධාතු මන්දිරය පිළිබඳ තොරතුරු ඉතාම අල්ප ය. පොළොන්නරු යුගයෙහි මෙතෙක් හමු වී ඇති සාධක

අනුව තුන් දා ගෙදර යන වචනය සඳහන් වන්නේ නිශ්ශංකමල්ල රජුගේ **අල්ලයි සන්නසෙහි** සහ **දොරටියාව සන්නසෙහි** පමණක් බව පී. ඊ. ඊ ප්‍රනාන්දු සඳහන් කරයි (Wickramasinghe, 1933). එනමුත් මෑත භාගයේ හමු වී ඇති අභිලේඛන සාධක අනුව එය චෝඩ ගංග රජුගේ බමුණාගල තඹ සන්නස තුළින් සහ පාතයාළ සෙල්ලිපියෙහි අන්තර්ගත වන බව ද පෙන්වා දිය යුතු ය.

> තුන් දා ගෙදරැ අභිෂේක මණ්ඩපයට වැඩැ, තුන් දා ගෙදෙරැ මඟුල් ගෙට පිවිසැ (රෝහණධීර, 2011).

තුන් දා ගෙදර යනු තුන් වර්ගයක සර්වඥ ධාතූන් නිධන් කොට ඇති ගෘහය ලෙස ද ප්‍රනාන්දු අරුත් සපයයි (Fernando, 1978). එයට හේතු වශයෙන් ප්‍රනාන්දු පෙන්වා දෙන්නේ නව්‍ය නායකයෙකු අභිෂේක මංගල්‍යය සිදු කිරීමේ දී දළදා පාත්‍ර ධාතූන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීම එකල චාරිත්‍රයක් වශයෙන් දක්නට ලැබුණු බවයි. එය පරාක්‍රමබාහු රජු රුහුණේ පැවති දළදා පාත්‍රා ධාතූන් උත්සවශ්‍රීයෙන් පොළොන්නරුවට වැඩමවා අභිෂේක උත්සවයක් සිදු කිරීමෙන් (Wickramasinghe, 1933) පැහැදිලි වෙයි. බුදුරජාණන් වහන්සේගේ කේශ ධාතූන් පිළිබඳව එහි සඳහන් වන හෙයින් අභිෂේක මණ්ඩපයෙහි දළදා පාත්‍ර ධාතූන් සමග කේශ ධාතු ද තැන්පත් කර තිබුණි ද? එහෙයින් තුන් දා ගෙදොර යන්න ව්‍යවහාර වුණි ද? යන්න පැනයක් ඇති බවත්, එය නිශ්චිතව ප්‍රකාශ කිරීමට තොරතුරු විරල බවත් තව දුරටත් පෙන්වා දෙයි. තවද මෙම යුගයෙහි සර්වඥ ධාතුත්‍රයක් පිළිබඳ සංකල්පයක් පැවති බවට I විජයබාහු රජුගේ **පනාකඩුව තඹ සන්නසෙහි** දැක්වෙන ධාතුත්‍රයේ අධිපතියා අරුත දෙන 'තුන් දා දෙටු' යන්න තුළින් පැහැදිලි වෙයි.

එමෙන් ම **බමුණාගල තඹ සන්නසෙහි** දැක්වෙන පරිදි 'තුන් දා ගෙදර මඟුල් ගෙය' ද මෙම අභිෂේක මණ්ඩලයම බව නිශ්චිත ය. එබැවින් සර්වඥධාතූන් සමීපයෙහි ම අභිෂේක මණ්ඩපය තිබූ බව ද, රාජ්‍ය නායකයා බෞද්ධයකු වූ හෙයින් රටෙහි සමස්ත ජනයා බෞද්ධ ආගම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී ඇති බව ද, සිතිය හැකි ය. ඒ අනුව නිශ්ශංකමල්ල රජතුමා කාලිංග වංශික රජ කෙනෙකු වුව ද බෞද්ධ ආගම ප්‍රමුඛ කර ගනිමින් එයට ගරු කරමින් සිය පාලන කටයුතු ගෙන ගොස් ඇති අතර එමගින් 'ලාංකේය පාලකයා බෞද්ධයකු විය යුතු ය' යන පූර්ව චාරිත්‍රයට ගරු කළ බවක් ද පැහැදිලි වෙයි.

නිගමනය

සන්නස් වනාහි රාජ්‍ය මුද්‍රාව සහිතව සිදු කරන්නා වූ ලේඛනයකි. මෙම ලේඛනය බොහෝ සෙයින් බලාත්මක කර ඇත්තේ ආයතනයකට විහාරස්ථානයකට හෝ පෞද්ගලික වශයෙන් සිදුකරන ඉඩකඩම්, වෙනත් භෞතික වස්තු හා තනතුරු ප්‍රදානයන් ආදියට පමණි. අනුරාධපුර යුගයේ ලියැවුණු සන්නස් දැකගත හැකි වුවත් ආකෘතිකමය ලක්ෂණයන්ගෙන් හෙබි සන්නස් මුල් රට හමුවන්නේ පොළොන්නරු යුගයේ දී ය. එබැවින් සන්නස් සාහිත්‍යයේ ආරම්භක යුගය වන්නේ පොළොන්නරු යුගයයි.

දැනට හමු වී ඇති සාක්ෂ්‍යය අනුව පොළොන්නරු යුගයට අයත් සන්නස් හතරක් දැක ගත හැකි අතර මෑත යුගයේ හමු වූ බමුණාගල සන්නසෙන් ඓතිහාසික මූලාශ්‍රගත ග්‍රන්ථයන්ගෙන් ද හෙළි නොවන ඉතා අප්‍රකට තොරතුරු රැසක් හෙළිවීම සුවිශේෂ ය. එමෙන් ම මෙකී සන්නස්වලින් තත්කාලීන සමාජය තොරතුරු, එකල රජුගේ බලය සහ රාජ්‍ය සභාවෙහි ව්‍යුහය, විවිධ බදු ප්‍රතිපත්තිමය ක්‍රම සහ ආර්ථික සාධක, ඉතා අප්‍රකට ආගමික තොරතුරක් වන තුන්දා ගෙදර අභිෂේක මණ්ඩපය පිළිබඳව ද තොරතුරු විද්‍යමාන ය.

උක්ත තොරතුරු අනුව විමසන කල පොළොන්නරු යුගයේ පනාකඩුව, අල්ලයි, දොරටියා, බමුණාගල යන සන්නස් විමර්ශනයෙන් තත් යුගයෙහි ඉතාමත් අප්‍රකට තොරතුරු රැසක් අනාවරණය වන බව නිගමනය කළ හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරවංශ හිමි, කොත්මලේ. (1969). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ආචාර්ය හරිශ්චන්ද්‍ර, විජයතුංග. (2017). *ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය.* කොළඹ 11: ගුණසේන සහ සහෝදරයෝ.

කුමාරස්වාමි, ආනන්ද. (1962). *මධ්‍ය කාලීන සිංහල කලා.* සංස්කෘතික දෙපාර්තමේන්තුව.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. (සංස්). (1997). *පූජාවලිය.* කොළඹ: ගුණසේන සහ සමාගම.

කොඩ්රින්ටන් එස්. ඩබ්ලිව්. (1980). *ලංකාවේ පුරාතන ඉඩම් භුක්තිය හා ආදායම.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

චන්‍දසිරි හිමි. (2007). *ලක්දිව අභිෂේක මංගල්‍යය.* වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

නන්ද හිමි මාමඬලේ. සුජාත හිමි තලුන්නේ. සමාධි හිමි බණ්ඩාරදූවේ. ශ්‍රී බුද්ධ වර්ෂ (2562) ව්‍යවහාරික වර්ෂ (2018). *භාෂා අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය* (සංස්). හෝමාගම: ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

තිස්ස කුමාර, ආනන්ද. (2006). *සිංහල සන්නස් හා තුඩපත්.* කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රෝහණධීර බද්දේගම. (2011). *ගිං ගඟේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* {PGIAR} ප්‍රකාශනයකි.

රෝහණදීර, මැන්දිස්. (1998). *නිශ්ශංකමල්ල පොළොන්නරු යුගය.* මහරගම: තරංජී ප්‍රින්ටර්ස්.

ලියනගමගේ, අමරදාස. (1989). *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සුමංගල නායක මාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා. (සංස්). (2006). *මහාවංශය.* ප්‍රථම භාගය. කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ.

Dewaraja L. S. (1972). *The Kandyan Kingam.* (Lake house Investments Ltd,) "Kandyan Land Grants as Sources of Eighteenth Century History" historycal Essays.

De. Z. Wickramasinghe. (1933). *Epigraphia Zeylanica.* Vol III, Ed. D. M, London; Oxford University Prees

De. Z. Wickramasinghe. (1912). *Epigraphia Zeylanica.* Vol I**,** Ed. D. M, London**;** Oxford University Prees.

Fernando, P. E. E. (1978). *Sri Lanka Journal of the Humanities.* Vol IV.

Journal of the Ceylon Branch of the Royal Asiatic Society. (1925) Colombo; The Colombo A pothecabies Company, Ltd Printers, Vol XXIX, No 77, part I, II, III, IV.

Ranawella, G. S. (2007). *Inscription of Ceylon.* V0l VI, Sri Lanka: Department of Archaeological.

Wickramasinghe D. M. D. Z. (1978). *Epigraphia Zeylanica.* Vol II, Archaeological Survey of Ceylon.